## ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය අන්තර්කරණ අධ්‍යාපනය සඳහා වූ මූලික සැලැස්මකට මුල පුරයි



ශ්‍රී ලංකාවේ දුබලතා සහිත ළමයින් බොහෝ දෙනෙකු පාසල්වල සාමාන්‍ය පන්ති කාමරවල සහ විශේෂ අධ්‍යාපන ඒකකවල අධ්‍යාපනය ලබමින් සිටින බව ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය වාර්තා කරයි[1]. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දුබලතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපන පිළිවෙත් පිළිබඳව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හෙවත් UNICEF විසින් පළ කර තිබෙන ජාතික පැතිකඩ වාර්තාවෙන් හෙළි වන්නේ දුබලතා සහිත ළමයින් අධ්‍යාපනය ලබාගැනීම සහ අධ්‍යාපනික වශයෙන් සාර්ථක වීම සම්බන්ධයෙන් එකිනෙක බැඳුණු බාධා රැසක් තවමත් පවතින බවයි[2]. විශේෂයෙන් අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන්ගේ කුසලතා සීමිත වීම, පාසල්වල සුදුසු සහ ප්‍රවේශ විය හැකි යටිතල පහසුකම් නොමැතිකම සහ විෂයමාලාවල සීමිතබව යනාදිය මෙම බාධා අතර වේ.

ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) තාක්ෂණික සහයෝගීතාවෙන් අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශය (REACH-SS) වැඩසටහන හරහා විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරයි.

2020 වර්ෂයේ නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ 37/2020 චක්‍රලේඛය ක්‍රමානුකූලව සාරථකව ක්‍රියාත්මක කර ගැනීම සඳහා පාර්ශවකරුවන් අතර පොදු අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා මධ්‍යම කාලීනව (වසර 3) සහ දිගු කාලීන (අවුරුදු 5-10) සැලැසුම් සකස් කිරීම සඳහා කාර්ය සාධක බලකායක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කර ඇත. REACH-SS සහ අනෙකුත් සංවර්ධන හවුල්කරුවන්ගේ නියාමක ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ඒ සමග සම්බන්ධ කර තිබේ.

මෙම කාර්ය සාධක බලකායේ පළමු රැස්වීම 2022 අප්‍රේල් 6 වැනි දින පවත්වන ලදී. එහිදී *2019-2030 අන්තර්කරණ අධ්‍යාපන සැලැස්ම* නැවත සලකා බැලීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශයේ අන්තර්කරණ අධ්‍යාපන චක්‍රලේඛයට අනුකූල වන පරිදි එම සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කරන ලදී. ඒ අනුව, එම ක්‍රියාවලිය සඳහා විශේෂඥ සහාය ලබා ගනිමින් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා මූලික සැලැස්මක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

---

1 Number of children with disabilities enrolled in regular and special education units in schools, 2012, Ministry of Education, Education Sector Development Framework and Programme (ESDFP) 2013–2017, Ministry of Education Policy and Planning Branch, Battaramulla, 2012 (Figure 1 - https://www.unicef.org/rosa/media/17016/file/Country%20Profile%20-%20Sri%20Lanka.pdf).

2 Disability-Inclusive Education Practices in Sri Lanka, UNICEF, 2021 - https://www.unicef.org/rosa/media/17016/file/Country%20Profile%20-%20Sri%20Lanka.pdf



එම මූලික සැලැස්මෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සියලුම ළමයින්ට ඔවුන්ගේ වෙනස්කම් මත අගතියකින් තොරව උසස් තත්ත්වයේ අධ්‍යාපන අවස්ථා ලබාගැනීමේ අවස්ථාව සහතික කිරීමයි. ඒ අනුව, අදාළ පාර්ශ්වයන් විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම් බෙදාගැනීමේ අරමුණින් අන්තර්කරණ අධ්‍යාපන (IE) මූලික සැලැස්මක් කෙටුම්පත් කිරීම සඳහා වැඩමුළුවක් 2023 සැප්තැම්බර් 12 සහ 13 යන දිනයන්හිදී පවත්වන ලදී. උප කාණ්ඩවල කුලුනු හතර මත පදනම්ව අන්තර්කරණ අධ්‍යාපන මහා සැලැස්ම සංවර්ධනය කිරීම එහි තවත් අරමුණකි.

හඳුනාගන්නා ලද කුලුනු හතර මෙසේය:

1. අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහ සහභාගීත්වය
2. සියලුම සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනය සඳහා අවස්ථා
3. පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන භාවිතාවන් ශක්තිමත් කිරීම: අධ්‍යාපන පද්ධතියේ ධාරිතා සංවර්ධනය
4. අධ්‍යාපන පද්ධතිය තුළ අන්තර්කරණ අධ්‍යාපන සංස්කෘතියක් නිර්මාණය කිරීම

සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් තොරව අන්තර්කරණ අධ්‍යාපනය සම්පූර්ණ කළ නොහැකිය. කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබෙන්නේ ජාතික මට්ටමින් ව්‍යාපෘති අත්දැකීම් බෙදාගැනීම ඔස්සේ අන්තර්කරණ අධ්‍යාපනය සඳහා මූලික සැලැස්මක් සකස් කිරීම සඳහාය. අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සහ ඉන් පිටත සිටින අන්තර්කරණ අධ්‍යාපනය හා සම්බන්ධ පුළුල් පරාසයක පාර්ශවකරුවන්ට වැඩමුළුවේ සංවිධායකයන් විසින් ආරාධනා කරන ලදී.

වැඩමුළුවට සහභාගී වූවන් අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් සහ විශේෂ අධ්‍යාපන ශාඛාව, මානව සම්පත් සංවර්ධන ශාඛාව, අධීක්ෂණ සහ කාර්ය සාධන සමාලෝචන ශාඛාව, පර්යේෂණ සහ සංවර්ධන ශාඛාව, ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව, සැමට අධ්‍යාපනය ශාඛාව, පාසල් කටයුතු ශාඛාව, පාසල් ක්‍රියාකාරකම් ශාඛාව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව, විෂය සමගාමී, මාර්ගෝපදේශන සහ උපදේශන ශාඛාව, ශාරීරික අධ්‍යාපන සහ ක්‍රීඩා ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව, ජාතික විශේෂ සහ අන්තර්කරණ අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන හා ප්‍රාථමික අධ්‍යාපන අංශ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය, මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලය සහ දුබලතා සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය, JICA, UNICEF, Save the Children යන ආයතනවල නියෝජිතයන් සිටි අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ලීනා මහත්මිය නිරීක්ෂකයෙකු ලෙස සහභාගී වූහ.



වැඩමුළුව විවෘත කරමින් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ප්‍රසාද් සේතුංග මහතා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපන පීඨ සිය අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා තුළ අන්තර්කරණ අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කර ඇති බවයි. එහි අරමුණ පන්ති කාමර තුළ අන්තර්කරණ අධ්‍යාපනය භාවිතා කරන අධ්‍යාපනවේදීන් සමූහයක් නිර්මාණය කිරීමයි. ‘‘අන්තර්කරණ අධ්‍යාපනය ආරම්භ වන්නේ ඉගෙනුම් ප්‍රතිඵල උපරිම කිරීමෙනුයි. එසේ කිරීමෙන් ගුරුවරුන්ට සියලුම සිසුන් සමඟ පාඩමේ අරමුණු ප්‍රායෝගිකව සාක්ෂාත් කරගත හැකියි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව අමාත්‍යවරයා ද දැඩි උනන්දුවක් දක්වනවා. ඒ නිසා අපි එකතුවෙලා මේ මූලික සැලැස්කම සැකසීම අවසන් කරන්නට කටයුතු කරමු,’’ යි ඔහු පැවසීය.

විවිධ අංශවල නියෝජිතයින් විසින් එක් එක් අංශය මූලික සැලැස්මට දායක වන ආකාරය පැහැදිලි කරන ලදී. REACH-SS කණ්ඩායම් නායක ෂුහෙයි ඔගුචි මහතා විසින් වැඩමුළුව ආරම්භක අවස්ථාව මෙහෙයවන ලදී.